**කඩුවෙල මහා නගර සභාව - 2020**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

කඩුවෙල මහා නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කඩුවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයට අදාළව මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 15.13 වගන්තිය ප්‍රකාරව 2155/6 හා 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ අවධාරණය කර තිබුණි.<br>උදා - වරිපනම් රු.644,362 කින් කපා හැර ඇත. | සභාව මගින් කපා හැරීමට නිර්දේශ කළ හැකි මුදල කපා හැර ඇති අතර ඉතිරි මුදල් කපා හැරීම් සම්බන්ධයෙන් නෛතික ආවරණයක් ලබා ගැනීමට කටයුතු කර ඇත. | ප්‍රමිත හා ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදය පරිදි 2020 වර්ෂයට පෙර ඉදිකරන ලද මංමාවත්, බෝක්කු හා පාලම් වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | පිළිගනිමි. 2020 ට පසු වටිනාකම් ගිණුම්ගත කර ඇත. | ප්‍රමිත හා ගැසට් පත්‍රය ප්‍රකාරව නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදය පරිදි 2020 වර්ෂයට පෙර ඉදිකරන ලද ගොඩනැගිලි 10 ක වටිනාකම සහ 2020 වර්ෂයට පෙර සභාවට අත්පත් කරගත් ඉඩම් 32 ක වටිනාකම දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | ගිණුම් ප්‍රමිත ප්‍රකාරව සභාව සතු සියළුම දේපළ, පිරියත හා උපකරණ ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 වර්ෂය තුළ මිලදී ගත් රු.2,300,000ක් වටිනා බෝධි ගොඩැල්ල ඕවිට ඉඩම රු.2,391,000ක ආරම්භක ප්‍රත්‍යාගණන ශේෂයට ඇතුළත්ව තිබියදී නැවතත් සමාලෝචිත වර්ෂය තුළ අත්පත් කර ගැනීම් ලෙස රු.2,300,000 ක් ගිණුම්ගත කිරීමෙන් ඉඩම් ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | දෝෂය සිදුව ඇති බව පිළිගනිමි. ඒ අනුව ජර්නල් සටහන් මගින් අදාළ දෝෂය නිවැරදි කිරීම සඳහා කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 05 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපයෝගි පොත් / උපලේඛන අනුව වටිනාකම අතර රු.47,909,550 ක වෙනසක් විය. | උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි. | උපයෝගි පොත් හා උපලේඛන නිවැරදි කළ යුතුවේ. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විගණනය සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.319,545,226ක් වූ ගිණුම් විෂයයන් 5 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | පිළිගනිමි. | අදාල ගනුදෙනුව හඳුනාගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. |

**1.7 අනුකූල නොවීම්**

1.7.1 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත | | | |
| | (i) 254(අ)(2) වැනි වගන්තිය | මෙම වගන්තිය ප්‍රකාරව අවශ්‍ය සියළු පියවර ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දිනට ආදායම් විෂයයන් 5ක් සඳහා අයවිය යුතුව තිබුණු රු.86,010,074ක් වූ හිඟ මුදල් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු කරමි. | නගර සභා ආඥා පනත ප්‍රකාරව අයවිය යුතු මුදල අයකර මහා නගර සභා අරමුදලට බැර කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ii) මු.රෙ 571 | තැන්පත් කළ දින සිට වර්ෂ 2ක් ඉක්මවූ රු.21,176,993 ක් වූ පොදු තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.294,584,222 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.485,243,772 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාවට අයවිය යුතු රු.644,362 ක හිඟ වරිපනම් ශේෂයක් සභා තීරණයක් මත ලේඛනවලින් ඉවත්කර තිබුණි. | සභාව මගින් කපා හැරීමට නිර්දේශිත මුදල කපා හැර ඉතිරි මුදල් සඳහා නෛතික උපදෙස් අපේක්ෂා කරමි. | විධිමත් අනුමැතිය මත කපා හැරීම් සිදුකිරීමට කටයුතු කළ යුතුවේ. |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිඟ හිටි වරිපනම් | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟ හිටි වරිපනම් වටිනාකම රු.73,338,420 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ හිටි වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | විනෝද බදු | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට කඩුවෙල දිස්ත්‍රික් කාර්යාලයට අයවිය යුතුව පවතින විනෝද බදු වටිනාකම රු.3,964,230 ක් විය. | 2018.07.30 දිනට පැවති හිඟය අනුව අයකර ගැනීම සඳහා නඩු පවරා ඇත. | හිඟ විනෝද බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ඇ) බස් නැවතුම්පළ ගාස්තු

-------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.103,299 ක් වුවද, එය අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | විධිමත් පරිදි අයකර ගැනීමට නොහැකි වූ අතර ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ බස් නැවතුම්පළ ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ඈ) මුද්දර ගාස්තු සහ උසාවි දඩ

----------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.700,000,000ක් හා ලැබිය යුතු උසාවි දඩ රු.3,000,000 ක් ද විය. | මුද්දර ගාස්තු හා උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කඩුවෙල බස් නැවතුම්පළෙහි කඩ කාමර 7 ක් සංවර්ධන කටයුත්තක් සඳහා 2019 ජනවාරි 01 දින සභාවට පවරාගෙන ඇතත් 2020 දෙසැම්බර් 30 දින වන විටත් සංවර්ධන කටයුතු අවසන් වී නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවට රු.416,600 ක ආදායමක් අහිමි වී තිබුණි. එසේම අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාලය මෙගා සිටි සාප්පු සංකීර්ණයට ගෙන ඒමේ තීරණය සඳහා 2019 පෙබරවාරි 20 දින කඩ කාමර 05 ක් සභාවට පවරා ගැනීම නිසා රු.111,100 ක ආදායමක් අහිමි වී තිබුණු අතර දිස්ත්‍රික් කාර්යාලය මෙගා සිටි ගොඩනැගිල්ලට ගෙන ගොස් නොතිබුණි. තවද 2016 සහ 2017 වර්ෂවලදී කඩ කාමර 08 ක් මුද්‍රා තබා තිබු අතර ඒ සම්බන්ධව නීතිමය පියවර නොගැනීම නිසා සභාවට රු.487,400 ක ආදායම් අහිමි වී තිබුණි. | කඩ කාමරවලින් ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන බව කඩ හිමියන් සභාව දැනුවත් කළ බැවින් කඩ කාමර හත 2019 ජනවාරි 1 වන දින සිට නැවත සභාව වෙත පවරා ගන්නා ලදී. පවතින වසංගත තත්ත්වය තුල හිඟය අයකිරීම සිදු කිරීමට නොහැකි වී ඇතත් හැකි ඉක්මනින් එම කටයුතු සිදු කිරීම ආරම්භ කරන බව දන්වමි. | යෝජිත සංවර්ධන කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය<br><br>නගර සහා බලප්‍රදේශයේ කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් කසළ ප්‍රවාහනය සඳහා කොන්ත්‍රාත් ආයතන 04 ක් යොදවා ගෙන සමාලෝචිත වර්ෂයේදී කසළ ප්‍රවාහනය සඳහා රු.47,504,958ක් ගෙවා තිබුණු අතර කසළ එකතු කිරීම සඳහා යන්ත්‍ර මිලට ගැනීම කොම්පෝස්ට් බඳුන් මිලට ගැනීම වැනි කසල එකතු කිරීමේ සමස්ථ ක්‍රියාවලිය සම්බන්ධයෙන් රු.230,810,439 ක වියදමක් දරා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සභාවේ කොම්පෝස්ට් අංගනය වැඩි දියුණු කිරීම සඳහා රු.5,855,000 ක් ගෙවා කොම්පෝස්ට් නිපදවන යන්ත්‍රයක් මිලදී ගෙන තිබූ අතර වසර අවසානයේදී කොම්පෝස්ට් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 177,465ක් විය. සභාවේ පස් අවුරුදු සැලැස්ම අනුව අදාළ ඉලක්කය කරා ළඟා වීමට මසකට කොම්පෝස්ට් නිෂ්පාදනය ටොන් 20 – 60 ක් දක්වා වැඩිකර ගත යුතු බව නිරීක්ෂණය කෙරේ. | කොම්පෝස්ට් නිෂ්පාදනය 5 අවුරුදු සැලැස්මේ නිෂ්පාදන ඉලක්ක අනුව සපුරා ගැනීමට පියවර ගනිමින් පවතී. | සැලසුම් අනුව ප්‍රශස්ථ මට්ටමට ළඟා වීමට කටයුතු කළ යුතුවේ. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගරාධිපති සහභාගිවන උත්සව සහ පොදු උත්සව ඡායාරූප ගත කිරීම හා වීඩියෝ කිරීම සඳහා සභාවේ මාධ්‍ය ඒකකය විසින් 2020 දෙසැම්බර් 31 දින රු.1,117,500 ක වටිනාකමින් යුත් වීඩියෝ කැමරාවක්, ඡායාරූප කැමරාවක් සහ ඊට අවශ්‍ය අනෙකුත් උපකරණ මිලදී ගෙන තිබුණු අතර මේ සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2(ඇ), 3.4.2, 6.3.6 වගන්තිවල උපදෙස් පිළිපැද නොතිබුණි. | මේ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොමැති නමුත් මිල ගණන් කැඳවා, අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයෙන් මිලදී ගැනීම් සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුවේ. |